ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2018
-------------------------------------------------

## 1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හේතුවෙන් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ බවක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හේතුවෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ සෑම වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4663 ක් ලෙස අගය දක්වා තිබුණු ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. මෙම නිසා මෙකී ඉඩම් හා ගොඩනැගිලි වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් පෙන්නුම් නොකෙරුණි. | පිළිගනිමි. ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම සඳහා තක්සෙරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. මේ වන විට දිස්ත්‍රික්ක 05 කට අදාල මධ්‍යස්ථානවල තක්සේරු කටයුතු අවසන් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විට අදාල වත්කම් පන්තියට අයිතිව තිබූ වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.4,496,902 ක් වූ මෝටර් රථ 39 ක් හා පාපැදි 25 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මේ පිළිබඳ සැලකිල්ලට ගෙන නිවැරදි කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 60 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය නිවැරදිව නියෝජනය වන ආකාරයට අදාළ ක්ෂය කිරීමේ පදනම හඳුනාගත යුතු අතර ඡේද අංක 74 අනුව භාවිතා කරන ක්ෂය ක්‍රමය වත්කමේ උපයෝජන රටාව නියෝජනය කලයුතුය. එහෙත් අධිකාරිය විසින් දෙසැම්බර් 31 දිනට වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීමේදී ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට ගෙන තිබුණද එම වත්කම් වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන අදාල ක්ෂය ප්‍රතිපත්තිය සංශෝධනය කර නොතිබුණි. | මේ පිළිබඳ සැලකිල්ලට ගෙන නිවැරදි කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදය පරිදි පශ්චාත් සේවක ප්‍රතිලාභ මැනීමේදී ආයුගණක ශිල්ප ක්‍රම භාවිතා කරමින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදුකල යුතු වුවත්, ඊට පටහැනි ලෙස අධිකාරිය විසින් සේවකයින් අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන සේවක ප්‍රතිලාභ මැනීම සිදුකර තිබුණු අතර ප්‍රමිතයේ 65 ඡේදය අනුව සේවක ප්‍රතිලාභ වගකීම් ශේෂය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. එසේම පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු. 2,135,660 ක් වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. 2020 වර්ෂයේදී අදාල ප්‍රමිතිය අනුව ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් අක්කර 06 රූඩ් 01 පර්චස් 13.2 ක් වූ ඉඩමකින් | දැනට නීත්‍යානුකූලව පවරාගෙන ඇත්තේ ඉඩම් 22 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී |

| | | |
|---|---|---|
| අක්කර 02 රූඩ් 03 පර්චස් 7.6 ක් 2015 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට පවරා දී තිබුණද එහි පොත් අගය වූ රු.202,278,158 ක් ,2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් වටිනාකමින් ඉවත් කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට ලැබී තිබුණු අක්කර 02 රූඩ් 03 පර්චස් 38.38 ක්වූ ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද අධිකාරියේ මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන රජයේ ඉඩම් 91 ක වටිනාකම තක්සේරු කර 2018 දෙසැම්බර් 31 දින දක්වාම ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ක් පමණි. ඉන් ඉඩම් 09ක් තක්සේරු කර ඇති අතර, අනෙකුත් ඉඩම් 13 තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එසේ තක්සේරු කර ලබා දීමෙන් පසුව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ජංගම නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වර්ග 4 කට අදාලව වර්ෂයේ ක්ෂය වියදම ගණනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය හා විලම්භිත ආදායම රු.211,926,365 ක් අඩුවෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. එසේම වත්කම් වර්ග දෙකකට අදාලව ප්‍රත්‍යාගණන අතිරික්තය රු.157,565,717 ක් අඩුවෙන් හා වත්කම් වර්ග දෙකකට අදාලව ප්‍රත්‍යාගණන අලාභය රු.54,420,648 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.54,420,648 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජංගම නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වලට අදාල සමුච්චිත ක්ෂය වෙන්කිරීම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු.43,119,356 ක් වැඩියෙන් හා සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වියදම රු. 2,733,488 ක් අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් යටතේ ගොඩනැගිලි ධාරණ අගය රු. 40,385,868 ක් හා වර්ෂයේ ඌනතාවය රු. 2,733,488 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිගනිමි. 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් සඳහා ක්ෂය ගණනය කිරීම් නිවැරදිව සිදු කල යුතුය. |
| (ඈ) 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ගෙවීමට සිදු වී තිබුණු රු.33,776,537 ක හිඟ දායක මුදල හා රු.5,641,480 ක අධිභාර මුදල් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ ඌණතාවයට ගැලපීම වෙනුවට | හිඟ මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදාල වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් නොලැබුණ බැවින් මුදල් ලැබුන වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් ගතකර ඇත. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ)නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය හා දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීමේ පදනම මත ලබා ගෙන තිබූ එකතු වටිනාකම රු. 211,713,535ක් වූ වත්කම් ගිණුම්වලින් අත්හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා වර්ෂයට අදාල ක්ෂය වියදම රු.5,878,664ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම විලම්භිත ආදායම් ගිණුමේ ශේෂයද රු. 5,878,664 ක් අඩුවෙන් හා විලම්භිත ආදායම් ප්‍රදාන ගිණුමේ ශේෂය රු. 187,622,028 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය හා දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන අරමුදල් යටතේ වූ වියදම් සියල්ල ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබයි. අදාල වියදම 2018 වර්ෂයේදී සිදු වුවද වාර්තා වූයේ 2019 වර්ෂයේදීය. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් වාහන යටතේ ගිණුම්ගත කර නොතිබූ මෝටර් වාහන 41 ක් ප්‍රත්‍යාගණනය කර එහි රු. 19,947,000 ක් වූ ප්‍රත්‍යාගණන වටිනාකම මෝටර් වාහන ගිණුමට එකතු කර තිබුණි. | මේ පිළිබඳව පරීක්ෂාකර නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය සතු සියලු වාහන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.4 අනුචිත ඇගයීම් හෝ ඇස්තමේන්තු කිරීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ කයිකාවල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීමේදී පවතින ගොඩනැගිල්ලේ ශක්තිමත්භාවය පිළිබඳ ඇගයීමක් සිදුකිරීමෙන් තොරව වහලය පමණක් ඉවත් කර 2017 වර්ෂයේදී රු. 17,445,822 ක් වැය කර නවීකරණ කටයුතු කිරීමට සැලසුම් කළ ගොඩනැගිල්ලේ වහලය ඉවත් කිරීමේදී එම ගොඩනැගිල්ලේ ගඩොල් කුළුණු අත්තිවාරමෙන් වෙන් වී තිබීම හේතුවෙන් අළුතින් කොන්ක්‍රීට් කුළුණු යොදා එම ගොඩනැගිල්ල නවීකරණය කිරීම, අමතර වැඩ යටතේ විශේෂ රේටයන් මත BOQ රේට වලට වඩා සියයට 43 සිට සියයට 150 දක්වා වැඩි රේටයන් සමඟ වැට් රහිතව රු. 1,170,000 ක් අනුමත කර තිබුණි. | වහළ රාමුව ගැලවීමේදී, එම රාමුව නිසා එකිනෙකට සම්බන්ධ වී ඇති බිත්ති කොටස් හා කුළුණු තනි වීම (Isolation) නිසා මෙසේ බිත්ති හා කුළුණු පිපිරීම වෙන්වීම සිදු වී ඇත. ඒ අනුව කොන්ත්‍රාත් ආයතනය ලබා දී ඇති මිළ ගණන් උපයෝගිකොට ගනිමින්ම සහ යම් යම් ආකාරවලට සැලසුම් වෙනස් කරමින් අමතර වැය වන මුදල අවම වන පරිදි නැවත සැලසුම් සකස් කර මෙම ව්‍යාපෘතිය කරගෙන යාමට කටයුතු කරන ලදී. | නිවැරදි ආකාරයට ඇස්තමේන්තු සකස් කිරීම තුලින් අමතර වැඩ අවම කරගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගෙන් අධිකාරියට අයවිය යුතු එකතුව රු. 3,819,000 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර 2019 ජූලි 18 දින දක්වාම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට ද කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් ආයතනයේ අසාර්ථක කාර්යය සාධනය හේතුවෙන් ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් මස අවසාන වන විටද ව්‍යාපෘතියේ වැඩ නිමකළ නොහැකි වූ හෙයින් 2015.01.05 දින ව්‍යාපෘතියේ වැඩ අත්හිටුවන ලදී.<br>මෙම අවස්ථාව වන විට කොන්ත්‍රාත් ආයතනයෙන් අයවිය යුතු රු. 3,819,000.00 ක මුදල එකවර සම්පූර්ණයෙන්ම අයකරගත නොහැකි බැවින් ව්‍යාපෘතිය අත්හිටුවන අවස්ථාව වන විට රඳවාගෙන ඇති මුදල හා ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ආයතනය සතුව රඳවාගෙන ඇති ද්‍රව්‍ය හා උපකරණ නැවත තක්සේරු කර සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමයි.<br>මෙම ව්‍යාපෘතියේ ඉතිරි කොටස නිම කිරීම සඳහා 2016-2017 ප්‍රසම්පාදන සැලැස්මට ඉදිරිපත් කර තිබුණ ද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන කපාහැරීම නිසා ඉදිරිකටයුතු සිදු කිරීමට නොහැකි විය. | අධිකාරිය වෙත අයවිය යුතු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නුවරඑළිය දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වනරාජවත්ත නැමැති ඉඩමෙන් රූඩ් 3 පර්චස් 31 ක් ලබා ගැනීම වෙනුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ 2013 අගෝස්තු මාසයේ ඇති කර ගත් එකඟත්වය මත 2018 අප්‍රේල් 20 දින රු. 9,280,000 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීම්කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින දක්වාම එම ඉඩම නිත්‍යානුකූලව අධිකාරිය වෙත පවරාගෙන දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් මිලදී ගැනීම සිදුකර ඇති අතර, අදාල ඉඩම සඳහා තුන්වන පාර්ශවයක් විසින් අභියාචනාධිකරනයේ නඩු පවරා ඇත. ඒ අනුව නඩුවේ තීන්දුව ලැබුන පසු ඉදිරි කටයුතු සිදුකරනු ඇත. | අදාල ඉඩම කඩිනමින් පවරාගෙන ආයතනයේ අරමුණු ඉටු කරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 1646 | අධිකාරියේ ප්‍රධාන කාර්යාලය භාවිතා කරනු ලබන වාහන 19 ක හා දිස්ත්‍රික් කාර්යාලවල භාවිතා කරනු ලබන වාහන 22 ක 2018 වර්ෂයට අදාල ධාවන සටහන් 2019 සැප්තැම්බර් මාසය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර එම වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන සඳහා රු.1,742,025 ක් වැයකර තිබුණි. | 2018 වර්ෂයට අදාල ධාවන සටහන් ලබා දි නොමැති අය දැනුවත් කිරීම ලිපි මඟින් සිදු කරන ලදි. එහි සිහිකැඳවීම් ලිපි නැවත වරක් 2019.12.31 දින ලබා දෙන ලදි. | ඉදිරියේදී නියමිත පරිදි ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ආ) 2019 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනි ලෙස අධිකාරියේ සේවකයින් 19 දෙනෙකු විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම් පිටවීම් වේලාවන් සටහන් කර නොතිබුණි. | මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කර උපදෙස් නිකුත් කර ඇත. ඉදිරියට මෙම තත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | අධිකාරියේ සියළුම නිලධාරීන් චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය | සෑම වාහනයකම මාස 12 කට වරක් හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනයෙන් පසුව ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවත් වෘත්තීය පුහුණු අධිකාරියේ වාහන සම්බන්ධයෙන් 2016 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් මාසය දක්වාම ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | 20.05.06. දින සියළුම වාහන සඳහා ඉන්ධන පරිභෝජන වාර්තාව සකස් කරන ලදි. | ඉදිරියේදී නියමිත පරිදි වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය | යොමුගත රෙගුලාසියට පටහැනි ලෙස අධිකාරියේ වාහන දෙක බැගින් අමාත්‍යවරයාගේ සහ රේඛීය අමාත්‍යාංශයේ රාජකාරී සඳහා මුදාහැර සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන වෙනුවෙන් අධිකාරිය රු. 712,870 ක් වැය කර තිබුණි. | අමාත්‍යාංශයේ වාහන නොමැති අවස්ථා වලදී හදිසි රාජකාරී අවශ්‍යතා සඳහා මෙම වාහනය ලබාදී ඇත. | අදාල වාහන අධිකාරියට පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 128,946,438 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 132,115,206 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,168,768 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම අඩු වූවාට වඩා වැඩි ප්‍රතිශතයකින් වියදම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2017 වර්ෂයේදී 1.49 ක්ව පැවති ජංගම වත්කම් අනුපාතය 2018 වර්ෂය වනවිට 1.09 ක් දක්වා අඩු වී තිබුණි. එනම් පෙර වර්ෂයට සාපේක්ෂව ජංගම වගකීම් පියවීම සඳහා පවතින ජංගම වත්කම් ප්‍රමාණය 0.40 කින් අඩුවී තිබුණි.

තවද ක්ෂණික වත්කම් අනුපාතය සැලකීමේදී 2017 වර්ෂයේදී 1.30 ක්ව පැවති මෙම අනුපාතය 2018 වර්ෂය වනවිට 1.00 දක්වා අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආංශික නිපුණතා සංවර්ධන අරමුදල්, භාණ්ඩාගාර අරමුදල් හා ලෝක කම්කරු සංවිධාන (ILO) අරමුදල් යටතේ 2016 වර්ෂයේ සිට 2019 ජූලි මාසය දක්වා මිලදීගෙන තිබුණු රු.8,362,833 ක් වටිනා පුහුණු උපකරණ අයිතම 1117 ක් අදාල පුහුණු මධ්‍යස්ථාන වෙත බෙදාහැරීමකින් තොරව අධිකාරියේ ප්‍රධාන ගබඩාවේ රඳවාගෙන තිබුණු අතර මෙම උපකරණ සඳහා ලබාදී තිබූ වගකීම් කාලයන් ගබඩාව තුලදීම කල් ඉකුත් වී තිබුණි. | මෙම සියළු උපකරණවලින් වැඩි ප්‍රමාණයක් මේ වනවිට බෙදා හැර ඇත. ඉතිරිය ඉදිරි කාලය තුල බෙදාහැරීම සඳහා සැලසුම් කර තිබේ. | මිලදී ගන්නා භාණ්ඩ කඩිනමින් බෙදා හැරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අධිකාරිය සතු වාහන අළුත්වැඩියා කිරීම හා වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන සිසුන් සඳහා රැකියාගත පුහුණුව ලබා දීමේ අරමුණ ඇතිව අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට පවත්වාගෙන තිබුණු වාහන නඩත්තු ඒකකය ආයතනයේ කාර්යසාධනයට ඵලදායී ලෙස දායක වී තිබියදී 2018 දෙසැම්බර් 31 දින සිට විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව වසාදමා තිබුණි. වාහන නඩත්තු ඒකකය පවත්වාගෙන ගිය වර්ග අඩි 3,136 කින් යුතු තක්සේරු වටිනාකම රු. 4,312,000 ක් වූ ගොඩනැගිල්ල හා භූමියෙන් කොටසක් 2020 වර්ෂයේ සිට වාහන පින්තාරු පාඨමාලාවක් සඳහා භාවිතා කරමින් පැවතුණි. | වාහන නඩත්තු කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍රවල අඩුපාඩුව හේතුවෙන් මෙම වාහන නඩත්තු ඒකකය වසා දැමීමට ඉහළ කළමනාකාරිත්වය තිරණය කර ඇත. මේ වන විට එම ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින් වාහන පින්තාරු පාඨමාලාවක් (NVQ 04) සිසුන් 20 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වඩාත් ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලබයි. එසේම වාහන නඩත්තු ඒකකයේ තිබූ උපකරණ මෝටර් කාර්මික අංශයේ අනෙකුත් පාඨමාලා සඳහා ලබා දී ඇත. | වෘත්තීය පුහුණුව සඳහා වන වැදගත් අංශයක් වසා දැමීම වෙනුවට අඩුපාඩු සම්පූර්ණ කරගෙන පවත්වාගෙන යාම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. එසේම උපයෝජිතව පවතින වත්කම් නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා ජීවන වියදම් දීමනාව නොසලකා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීම හේතුවෙන් රු. 5,641,480 ක අධිභාර මුදලක් සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා වේතන සඳහා ලබාදී තිබූ භාණ්ඩාගාර අරමුදල් මඟින් ගෙවා තිබූ අතර අදාළ වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම අධිභාර මුදල් ගෙවන ලදී. | නොසැලකිලිමත් ලෙස කටයුතු කල නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගත යුතුය. |
| (ආ) මධ්‍යස්ථාන 04 ක ඉදිකිරීම් නවීකරණ කටයුතු වෙනුවෙන් උපදේශන සේවා ලබා ගැනීම සඳහා අර්ධ රාජ්‍ය ආයතනයකට 2014 වර්ෂයේදී හා 2017 වර්ෂයේදී එකතුව රු.1,831,817 ක් ගෙවා තිබූ නමුත් එම මධ්‍යස්ථානවල නවීකරණ කටයුතු 2020 පෙබරවාරි 22 දින වන විටත් ආරම්භ කර නොතිබුණු අතර දිර්ඝ කාලයක සිට මෙම වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වුයේ නියමිත ප්‍රතිපාදන නොලැබුනු හෙයිනි. | එකී මධ්‍යස්ථානවල ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේනකඩුව පිහිටි වෙලේවත්ත නැමැති ඉඩමෙන් රූඩ් 02 පර්චස් 33.50 ඉඩම් ප්‍රමාණයක් රු. 5,823,000 ක් ගෙවා 2010 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණද 2020 පෙබරවාරි 24 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මෙම ඉඩම මිලදී ගෙන ඇත්තේ මධ්‍යස්ථානයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහාය. මේ වන විට හේනකඩුව මධ්‍යස්ථානයේ ආධුනිකයනගේ බාහිර ක්‍රියාකාරකම් සඳහා සහ දෛනික ක්‍රියාකාරකම් සඳහා මෙම ඉඩම ඵලදායි ලෙස යොදාගනු ලබයි. | අධිකාරිය පිහිටුවීමේ පනතේ අරමුණු ඉටු කරගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) අධිකාරිය විසින් ගාල්ල දිස්ත්‍රික් මුද්‍රණ පාසැල පවත්වාගෙන යනු ලබන ඉඩමේ පැරණි ගොඩනැගිල්ල ඉවත්කර රු. 36,347,620 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් යටතේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2016 ඔක්තෝබර් මාසයේදී ආරම්භකර තිබුණද 2018 අගෝස්තු 28 දින ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. එසේම එම ඉඩමේ අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2019 දෙසැම්බර් මාසය දක්වාම කටයුතු කර නොතිබුණි. තවද 2007 වසරේදී රු. මිලියන 15ක් පමණ වැයකර පුහුණු කටයුතු සඳහා මිලදීගෙන තිබුණු මුද්‍රණ යන්ත්‍රය 2018 අප්‍රේල් 03 දින සිට කොටසක් ඉදිකර තිබුණු නව ගොඩනැගිල්ලේ නිශ්කාර්යව තැන්පත් කර තිබුණි. ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් 2017 ඔක්තෝබර් මාසයේ සිට බදු පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක මුද්‍රණ පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර එම මාසයේ සිට 2019 ජූලි මාසය දක්වා බදු කුලිය ලෙස රු. 803,000ක් ගෙවා තිබුණි. | නව කොන්ත්‍රාත් සමාගම විසින් මෙම ගොඩනැගිල්ලේ කටයුතු 95% පමණ අවසන් කොට ඇති අතර පාඨමාලා පැවැත්වීම සඳහා කටයුතු කරමින් පවතී. එමෙන්ම මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් විසින් මේ වන විට සිදු කරමින් පවතී. | කඩිනමින් ඉදිකිරීම් වැඩ අවසන් කර ආධුනිකයන්ගේ පුහුණුවීම් කටයුතු සඳහා යොදාගත යුතුය. |
| (ඉ) නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතන භූමියේ වසර 01 ත් වසර 04 ත් අතර දීර්ඝ කාලපරිච්ඡේදයක් තුල අධිකාරියට ලියාපදිංචි අයිතිය නොමැති මෝටර් රථ 08 ක් හා ලියාපදිංචි අයිතිය හිමි මෝටර් බයිසිකලයක් අනාරක්ෂිතව නවතා තිබුණු බව 2019 මාර්තු 01 දින සිදුකල ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. මෙම මෝටර් වාහන 08 අළුත්වැඩියා කර භාවිතා කල හැකි මට්ටමේ පැවති බව නිරීක්ෂණය විය. | අධිකාරිය සතු වාහන 5 අළුත්වැඩියා කිරීම ඵලදායි නොවන බව කමිටුවක් මගින් සනාථ කර ඇති බැවින් මෝටර් රථ කාර්මික පාඨමාලා සඳහා නිදහස් කර ඇත. | පුහුණු කටයුතු සඳහා නිදහස් කර ඇති වාහනවල ලියාපදිංචි කිරීමේ පොත් සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

**3.3** **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් රු.මිලියන 7,430 ක් වැය කරමින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලා පවත්වනු ලබන පුහුණු මධ්‍යස්ථාන 90 ක් 2016 වර්ෂය අවසාන වන විට නවීකරණය කිරීමට හා 2017 වර්ෂය අවසාන වන විට නව පුහුණු මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම සඳහා සැලසුම්කර තිබුණි. එහෙත් 2018 දෙසැම්බර් 31 දින වන විට පුහුණු මධ්‍යස්ථාන 65 ක් නවීකරණය කර නොතිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 17 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | පිළිගනිමි. නියමිත ඉලක්කයට ළඟා වීමට නොහැකි වූයේ ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන ලබා නොදුන් බැවිනි | ව්‍යාපෘතියේ අරමුදල් ප්‍රමුඛතාවය අනුව අදාල අරමුණු වෙත යෙදවීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක ඉදිකිරීම් සැලසුම් සකස් කිරීම වෙනුවෙන් උපදේශකවරයෙකුට 2017 වර්ෂය තුළදී රු.635,961 ක් ගෙවීම්කර තිබුණද එම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් දක්වාම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාද වී ඇත්තේ ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් මෙතෙක් ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙනි. | ප්‍රතිපාදන ලබාගෙන ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කල යුතුය. |
| (ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කර තිබුණු අහංගම හෝටල් පාසලේ නවීකරණ කටයුතු වල මූලික සැලසුම් වෙනස් කිරීම හා ඉදිකිරීම් ප්‍රමාදවීම් හේතුවෙන් පාඨමාලාවන් 04 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවැත්වීමට නොහැකිවී තිබූ අතර නවීකරණ කටයුතු රු.121,809,064 ක් වැය කර 2018 මාර්තු 08 දින අවසන් කර ඇතත් 2019 සැප්තැම්බර් 30 දින දක්වාම සංචාරක හෝටලයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද පාඨමාලා සඳහා ප්‍රායෝගික පුහුණුවට අවශ්‍ය යැයි සඳහන් කරමින් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.28,158,840 ක පුහුණු උපකරණ හා රු.9,397,178 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | හෝටලයේ මෙහෙයුම් කටයුතු 2020.02.26 ආරම්භ කළ අතර, COVID - 19 වෛරසය හේතුවෙන් එම කටයුතු ඉදිරියට ගෙන යාමේ දුෂ්කරතා මතු වුව ද, ආයතනය විසින් එම කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මත කරමින් පවතී.<br>මෙම නවීකරණ ව්‍යාපෘතියට සමගාමීව නව හෝටලයක් සඳහා අවශ්‍ය උපකරණ මිලදීගැනීමේ ක්‍රියාවලියද සිදු කළ අතර ගොඩනැගිලි නවීකරණය ක්‍රියාවලිය වසර | අධිකාරිය පිහිටුවීමේ අරමුණු ඉටු කරගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | ගණනාවක් පුරා සිදුවීම තුළ මිලදීගත් උපකරණ යම්කිසි කාලයක් පුරා ප්‍රයෝජනයට නොගෙන පැවතීම සිදුවූ බව පිළිගනිමි. | |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයට වහාම දැනුම් දීම සිදු කල යුතු වුවත් මිරිජ්ජවිල ඉදිකිරීම් පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් 2019 ජනවාරි 30 දින වන විටත් අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වෙනස්කම් සඳහාද ප්‍රමාණවත් තරම් අමතර කාලයක් ලබා දුන් අතර, ඊට අමතරව ප්‍රමාද අලාභ ගාස්තු අයකිරීමට යටත්ව නමුත්, ව්‍යාපෘතිය නිම කිරීම සඳහා අවස්ථාව හා කාලය ලබා දෙන ලදී. එසේ වුවද අදාල කොන්ත්‍රාත් ආයතනයට ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කටයුතු කළ නොහැකි වූ අතර දිගින් දිගටම එහි කාර්යසාධනය දුර්වල වූ හෙයින් 2018.10.10 දින ව්‍යාපෘතිය අත්හිටුවන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2019 ජූලි 19 දින ඉදිකිරීම් පිළිබඳ සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අක්කර 4 ½ ක පමණ භූමියේ කෙලවරක ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පළමු මහලේ බිත්ති පුපුරා ගොස් තිබීම, විදුලි සැපයීම් කටයුතු ආරක්ෂිත ලෙස සිදු කර නොතිබීම, පළමු මහලේ සිමෙන්ති ගල් වලින් බැද තිබූ බිත්ති බොහොමයක් කඩාවැටී විනාශ වී තිබීම, එහි Colum නියමිත ප්‍රමිතියට සකස් කර නොතිබීම නිසා කොන්ක්‍රීට් ගැලවී යොදා තිබූ කම්බි පිටතට නිරාවරණය වී මලකෑමට ලක්වී තිබුණු අතර වසර 4 කට අධික කාලයක සිට ඉදිකිරීම් අත්හැර තිබීම නිසා මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වෙමින් පැවතුණි. | පළමු මහලේ සමහර බිත්ති පුපුරා ඇති බවටද, සමහර බිත්තිවල ගල් ගැලවී/බුරුල් වී ඇති බවද, කොන්ක්‍රීට් කුළුණු වලද සමහර ස්ථාන වල සවිවර බවක් (Honey Combs) ඇති බවද සත්‍යකි. මෙම දුර්වලතාවයන් නිසා කොන්ත්‍රාත්තුව අත්හිටු වීමට කටයුතු කරන ලදි. | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා අධිකාරියේ නිලධාරියෙකු යොදවා ඉදිකිරීම්වල ගුණාත්මකභාව තහවුරු කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ඉදිකිරීම් වැඩ අවසන් කර භාර නොදීම හේතුවෙන් ගිවිසුම් කඩ කිරීම මත 2015 ජනවාරි 05 දින මිරිජ්ජවිල වැඩහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණද කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි වලට පටහැනි ලෙස කොන්ත්‍රාත්කරුට අයිති ඉදිකිරීම් උපකරණ 58 ක් විගණන දිනය වූ 2019 ජුලි 18 දින දක්වාම නිදහස් කිරීමට කටයුතුකර නොතිබූ අතර ඒවා අනාරක්ෂිත ලෙස වැඩබිමේ තැම්පත් කර තිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් ආයතනයට ගෙවා ඇති අත්තිකාරම් මුදල හා ප්‍රමාද අලාභ ගාස්තු හා ඉතිරි ඉදිකිරීම් කොටස සඳහා වන 25% ක අධිභාරය අයකරගැනීම සඳහා වෙනත් ක්‍රමයක් නොමැති හෙයින් කොන්ත්‍රාත් ආයතනයට අයත්වන භාණ්ඩ හා උපකරණ මගින් අදාළ අයවීම් නිරවුල් කර ගැනීම සඳහා වේ. | කොන්ත්‍රාත් ගිවිසුමට පටහැනි ලෙස කටයුතු කිරීමෙන් ඉදිරියේදී වන්දි මුදල් ගෙවීමේ අවධානමක් ඇතිවිය හැකි බව පෙන්වා දෙමි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 13 කට අදාලව පැවැත්වීමට සැලසුම් කර තිබූ පූර්ණ කාලීන පාඨමාලා 09 ක හා අර්ධ කාලීන පාඨමාලා 39 ක පුහුණු වැඩසටහන් 64 ක් 2018 වර්ෂය තුලදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයෙහිදී පැවැත්වීමට සැලසුම් කල පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලාවන් අතුරින් විමසුම්ගත පාඨමාලාවන් විවිධ හේතූන් මත ආරම්භ කිරීමට නොහැකිවිය. | ළඟාවිය හැකි ඉලක්ක සැලකිල්ලට ගෙන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |